*සැ. යු.*-2014.09.05 දින පළ වූ අංක 1,879 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,880 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1591 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

*සැ. යු.*—අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්‍ෂා කිරීමේ පනත් කෙටුම්පත, 2014 අගෝස්තු මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු ඇබෑර්තු

## ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරි II පංතිය "ආ" බණ්ඩයේ (ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය) තනතුරෙහි පුරප්පාඩු 01ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය* :-

01.1 මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව "A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කොට "කර්මාන්තශාලීය ඉංජිනේරු, රජයේ කර්මාන්තශාලාව, කොලොන්නාව" යන ලිපිනයට 2014 සැප්තැම්බර් 26 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙළවරේ අයදුම් කරන තනතුරු නාමය පැහැදිළිව ලියා තිබිය යුතුය.

01.2 අයදුම්පත් බාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපෑලේ දී ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම වස් කල් වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කරන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

01.3 අයදුම්පතෙහි සඳහන් කර ඇති යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**සැළකිය යුතුයි** :

අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් සහ නියමාකාරයෙන් සම්පූර්ණකර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) *අධ්‍යාපන සුදුසුකම්* :

ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම.

(3) *වෘත්තීය සුදුසුකම්* :

පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමානයැයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

4. *වෙනත් සුදුසුකම්* :

විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත පිරිමි අයවලුන් විය යුතුය.

5. *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(IV) හි එම් එන් 3-2006-ඒ යටතේ රු. 15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 -රු. 27,885 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

6. *වයස් සීමාව* :

2014.09.26 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි වීම. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.)

7. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරඟ විභාගයකට යොමුකර, එම විභාගයේ වැඩිම ලකුණු ලබාගත් අය සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පමණක් පරීක්‍ෂා කරනු ලැබේ. සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය. ලිඛිත පරීක්‍ෂණයට අදාල විෂයයන් හා විෂය නිර්දේශය පහත පරිදි වේ.

1. කාර්මික දැනුම (පැය 01කි),

වාත්තු,, යන්ත්‍රනය, වැද්දුම්කරණය, පැස්සුම්කරණය, මෝටර් කාර්මික, වඩු කාර්මික හා නඩත්තු යන ක්ෂේත්‍රවලට අදාලව බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඩිප්ලෝමා හෝ සමාන සහතික ලාභියෙකු සතුව පැවතිය යුතු තාක්‍ෂණික දැනුම මට්ටම පරීක්‍ෂා කරන ආකාරයේ ප්‍රශ්න ඇතුලත් වේ.

2. සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්‍ෂණය (පැය 01කි).

- ශ්‍රී ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලනය, ක්‍රීඩා හා මෑත කාලයේ සිදුවූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබාගත් ජයග්‍රහණයන්ද ඇතුළුව) සහ,

- ලෝකයේ සිදුවූ වැදගත් සිදුවීම්, භූගෝලීය අනුව සිදුවන බෙදීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යය භාරයන්,
- අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ.

8. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2007.04.28 දින නිකුත් කර ඇති රා. ප. ච. අංක 07/2007 අනුව 2007.07.01 දිනට පසු සේවයට බැඳෙන සියලුම රාජ්‍ය නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳි වසර 05ක් තුළ ලබාගත යුතුය.

9. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

9.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

9.2 තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසිවලටද, රජය හෝ රේඛීය අමාත්‍යාංශය හා රජයේ කර්මාන්තශාලාව විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසි වලටද යටත් විය යුතුය.

9.3 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාල වේ.

9.4 පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

10. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එම්. කේ. පී. එස්. ආර්. ප්‍රනාන්දු,
කර්මාන්තශාලීය ඉංජිනේරු,
රජයේ කර්මාන්තශාලාව,
කොලොන්නාව.

**අයදුම්පත්‍රය**

***රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරි II "ආ" තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය***

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(iii) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :————.

02. ලිපිනය හා දුරකථන අංක :
(i) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

03. උපන් දිනය හා ස්ථානය :————.

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————. නිකුත් කළ දිනය :————.

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? :————.

07. (i) ස්ත්‍රී/පුරුෂභාවය :————.
(ii) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් :

(I) අ. පො. ස. (සා/පෙළ)

| විෂයය | සාමාර්ථය | විභාග අංකය | වර්ෂය |
|---|---|---|---|
| | | | |

(II) අ. පො. ස. (උ/පෙළ)

| විෂයය | සාමාර්ථය | විභාග අංකය | වර්ෂය |
|---|---|---|---|
| | | | |

09. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්වවිද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. වෙනත් සුදුසුකම් :————.

11. ජන වර්ගය (කොටුව තුළ නියමිත අංකය සටහන් කරන්න.)

| | |
|---|---|
| සිංහල | 1 |
| ශ්‍රී ලංකා දෙමළ | 2 |
| ශ්‍රී ලංකා මුස්ලිම් | 3 |
| ඉන්දියානු සම්භවයක් ඇති | 4 |
| වෙනත් | 5 |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : 2014 ————.

(මෙම කොටස අදාල වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට සහ පුහුණුවන්නන්ට පමණි.)

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

රජයේ කර්මාන්තශාලා දෙපර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරී II "ආ" තනතුර සඳහා ඉල්ලුම් කර සිටින ...................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ............................. මයා දැනට .................... තනතුරේ සේවය කරන/පුහුණුව ලබන බවද, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවද සහතික කරමි. ඔහු මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.
නිල මුද්‍රාව :————.

09-322

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු
සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට
බටහිර සංගීත ගුරුවරුන් බඳවා ගැනීම - 2014

දිවයිනේ පිහිටි රජයේ පාසල්වල පවතින බටහිර සංගීත ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයට බටහිර සංගීත ගුරුවරුන් බඳවා ගැනීම පිණිස අයදුම් පත් කැඳවනු ලැබේ.

(1) යෝග්‍යතා :

1.1 *සාමාන්‍ය සුදුසුකම්*

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
(II) යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය;
(III) 2014.10.13 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය;
(IV) මේ වන විටත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරකට පත්වීම ලබා නොමැති ඉල්ලුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

1.2 අධ්‍යාපන සුදුසුකම් හා අවශ්‍ය මූලික සුදුසුකම් :

1.2.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පිළිගත් ඕනෑම විශ්ව විද්‍යාලයකින් පියානෝව ප්‍රධාන හෝ අනු විෂයයක් ලෙස හදාරා ඇති බටහිර සංගීතය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

1.2.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ බටහිර සංගීතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළත්ව එක් වරක දී විෂයන් 03ක් සමත්ව තිබීම;

*හෝ*

1.2.3 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂයයන් 03ක් එක්වරක දී සමත්වීම;

*සහ*

පහත සඳහන් ආයතනයකින් බටහිර සංගීත vi වන ශ්‍රේණිය ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

(i) Department of Examinations, Sri Lanka ;
(ii) Trinity College of Music, London ;
(iii) Royal Schools of Music, London ;
(iv) London College of Music

සහ

1.2.4 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළත්ව සම්මාන 3ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයයන් 6කින් සමත්වීම.

02. බඳවා ගැනීම ක්‍රමය :

2.1 මෙම දැන්වීමට අදාළව ඉල්ලුම් කරන ලද අයදුම් කරුවන් වෙනුවෙන් සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය පදනම් කර ගෙන පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී සුදුස්සන් තෝරා ගැනීම සඳහා ලකුණු ලබා දීමේ පටිපාටිය අංක 1 උපලේඛනයේ සඳහන් වේ).

**උපලේඛනය - 1**

ඉහත 1.21, 1.22, 1.23හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන පහත දක්වා ඇති කොටස් 03කින් යුත් ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එක් කොටසකින් 50% බැගින්

කොටස් තුනෙන්ම අවම වශයෙන් ලකුණු 150ක් ලබා තිබිය යුතු වේ.

(i) බටහිර සංගීත සිද්ධාන්ත,
(ii) බටහිර සංගීත විෂයට අදාළ ශ්‍රවණ පරීක්ෂණය,
(iii) බටහිර සංගීත විෂයයට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය

ඉහත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය පදනම් කර ගෙන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

03. බටහිර සංගීත විෂයයට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පහත දක්වා ඇත.

*බටහිර සංගීත ගුරු භවතුන් බඳවා ගැනීම :*

| | පළාත | පළාත් පාසල් | ජාතික පාසල් | මුළු පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර පළාත | 31 | 35 | 66 |
| 2 | දකුණු පළාත | 7 | 31 | 38 |
| 3 | මධ්‍යම පළාත | 10 | 13 | 23 |
| 4 | වයඹ පළාත | 7 | 7 | 14 |
| 5 | ඌව පළාත | 3 | 11 | 14 |
| 6 | නැගෙනහිර පළාත | 3 | 9 | 12 |
| 7 | උතුරු මැද පළාත | 3 | 5 | 8 |
| 8 | සබරගමුව පළාත | 50 | 11 | 61 |
| 9 | උතුරු පළාත | 1 | 5 | 6 |
| | | 115 | 127 | 242 |

**උපලේඛනය - 2**

බටහිර සංගීත ගුරු භවතුන් බඳවා ගැනීම - ගුරු පුරප්පාඩු

| අනුක්‍රමික අංකය | බස්නාහිර ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ඩී. එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07 | 2 |
| 2 | ආනන්ද විද්‍යාලය, කොළඹ 10 | 2 |
| 3 | නාලන්දා විද්‍යාලය, කොළඹ 10 | 1 |
| 4 | තර්ස්ටන් විද්‍යාලය, කොළඹ 07 | 1 |
| 5 | ආනන්ද බාලිකා විදයාලය, කොළඹ 10 | 1 |
| 6 | රාජකීය විද්‍යාලය, කොළඹ 07 | 1 |
| 7 | අනුලා විද්‍යාලය, නුගේගොඩ | 1 |
| 8 | මහානාම විද්‍යාලය කොළඹ 07 | 1 |
| 9 | සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා මහා විද්‍යාලය, කොළඹ 07 | 1 |
| 10 | ශා. පාවුළු බාලිකා මහා විද්‍යාලය, කොළඹ 05 | 1 |
| 11 | හින්දු විද්‍යාලය, කොළඹ 04 | 1 |
| 12 | දේවි බාලිකා මහා විද්‍යාලය, කොළඹ 08 | 1 |
| 13 | කොලොන්නාව බාලික විද්‍යාලය, කොලොන්නාව | 1 |
| 14 | ශ්‍රී සුභූති මහා විද්‍යාලය, බත්තරමුල්ල | 1 |
| 15 | වේල්ස්කුමර විද්‍යාලය, මොරටුව | 1 |
| 16 | වේල්ස් කුමරි විද්‍යාලය, මොරටුව | 1 |
| 17 | රාමනාදන් හින්දු බාලිකා විද්‍යාලය, කොළඹ 04 | 1 |
| 18 | ආනන්ද ශාස්ත්‍රාලය, කෝට්ටේ | 1 |
| 19 | ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය | 1 |
| 20 | පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය, පිළියන්දල | 1 |
| 21 | මුස්ලිම් බාලිකා විද්‍යාලය, කොළඹ 04 | 1 |
| 22 | ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලය, ගනේමුල්ල | 1 |
| 23 | ගුරුකුල මහා විද්‍යාලය, කැළණිය | 1 |
| 24 | සෙනරත් පරණවිතාන මහා විද්‍යාලය, උඩුගම්පොල | 1 |
| 25 | නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය, මීගමුව | 1 |
| 26 | ශාන්ත අන්තෝනි මධ්‍ය මහා විද්‍යාලය, වත්තල | 1 |
| 27 | රත්නාවලී බාලිකා මහා විද්‍යාලය, ගම්පහ | 1 |
| 28 | හරිස්චන්ද්‍ර ජාතික පාසල, මීගමුව | 1 |
| 29 | ක්‍රිස්තුරාජ ජාතික පාසල, ජාඇල | 1 |
| 30 | ඩී. එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, බේරුවල | 1 |
| 31 | ශාන්ත ජෝන් විද්‍යාලය, කළුතර | 1 |
| 32 | මහින්ද රාජපක්ෂ විද්‍යාලය, පිටිපන | 1 |
| | එකතුව | 35 |

| අනුක්‍රමික අංකය | දකුණු පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 33 | රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල | 1 |
| 34 | ශාන්ත තෝමස් බාලිකා විද්‍යාලය | 1 |
| 35 | ශ්‍රී දේවානන්ද විද්‍යාලය, අම්බලන්ගොඩ | 1 |
| 36 | ශා. ඇලෝසියස් විද්‍යාලය, ගාල්ල | 1 |
| 37 | විද්‍යාලෝක විද්‍යාලය, ගාල්ල | 1 |
| 38 | සුජාතා විද්‍යාලය, මාතර | 1 |
| 39 | ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, ඇල්පිටිය | 1 |
| 40 | කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය, කරන්දෙණිය | 1 |
| 41 | බටේමුල්ල මධ්‍ය මහා විද්‍යාලය, ඉමදුව | 1 |
| 42 | ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය, බද්දේගම | 1 |
| 43 | ක්‍රිස්තුදේව පිරිමි විද්‍යාලය, බද්දේගම | 1 |
| 44 | දේවපතිරාජ විද්‍යාලය, රත්ගම | 1 |
| 45 | ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය, හික්කඩුව | 1 |
| 46 | ශ්‍රී ලංකා සිංගප්පූරු මිත්‍රත්ව ජාතික පාසල, වීරකැටිය | 1 |
| 47 | ශ්‍රී රේවත ජාතික පාසල, අම්බලන්ගොඩ | 1 |
| 48 | මහින්ද රාජපක්ෂ විද්‍යාලය, මාතර | 1 |
| 49 | සවුත්ලන්ඩ්ස් බාලිකා විද්‍යාලය, ගාල්ල | 1 |
| 50 | ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ | 1 |
| 51 | දෙනියාය මධ්‍ය මහා විද්‍යාලය, දෙනියාය | 1 |
| 52 | කීර්ති අබේවික්‍රම මධ්‍ය මහා විද්‍යාලය, මොරවක | 1 |

| අනුක්‍රමික අංකය | දකුණු පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 53 | මාතර මධ්‍ය මහා විද්‍යාලය, මාතර | 1 |
| 54 | ශා. සර්වේශස් විද්‍යාලය, මාතර | 1 |
| 55 | රේරපුත්ත ජාතික පාසැල, හම්බන්තොට | 1 |
| 56 | ශා. මේරි ජාතික පාසල, හම්බන්තොට | 1 |
| 57 | දෙබරවැව ජාතික පාසැල, තිස්සමහාරාම | 1 |
| 58 | සූරියවැව ජාතික පාසැල, සූරියවැව | 1 |
| 59 | වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලය, හම්බන්තොට | 1 |
| 60 | තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය, මාතර | 1 |
| 61 | වලස්මුල්ල ජාතික පාසල, වලස්මුල්ල | 1 |
| 62 | තංගල්ල බාලිකා විද්‍යාලය, තංගල්ල | 1 |
| 63 | ඌරුබොක්ක මධ්‍ය මහා විද්‍යාලය, ඌරුබොක්ක | 1 |
| | එකතුව | 31 |

| අනුක්‍රමික අංකය | මධ්‍යම පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 64 | අමුපිටිය මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 65 | ගාමිණී ජාතික පාසල, නුවරඑළිය | 1 |
| 66 | ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසල, මාතලේ | 1 |
| 67 | තෙල්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 68 | විජය ජාතික පාසල, මාතලේ | 1 |
| 69 | ක්‍රිස්තුදේව ජාතික පාසල, මාතලේ | 1 |
| 70 | ශ්‍රී සුමංගල ජාතික පාසල, වලපනේ | 1 |
| 71 | පාක්යම් දෙමළ ජාතික පාසල, මාතලේ | 1 |
| 72 | පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර | 1 |
| 73 | ශ්‍රී නාග ජාතික පාසල, නාවුල | 1 |
| 74 | ධර්මරාජ විද්‍යාලය, මහනුවර | 1 |
| 75 | උසස් බාලිකා විද්‍යාලය, මහනුවර | 1 |
| 76 | නුගවෙල බාලිකා මධ්‍ය මහා විද්‍යාලය, මහනුවර | 1 |
| | එකතුව | 13 |

| අනුක්‍රමික අංකය | වයඹ පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 77 | මලියදේව පිරිමි විද්‍යාලය, කුරුණෑගල | 1 |
| 78 | සදලංකාව මධ්‍ය මහා විද්‍යාලය, සදලංකාව | 1 |
| 79 | වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල | 1 |
| 80 | ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, හලාවත | 1 |
| 81 | ආනන්ද ජාතික පාසල, පුත්තලම | 1 |
| 82 | පන්නල ජාතික පාසල, පන්නල | 1 |
| 83 | සේනානායක ජාතික පාසල මාදම්පේ | 1 |
| | එකතුව | 7 |

| අනුක්‍රමික අංකය | ඌව පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 84 | ධර්මදූත මධ්‍ය මහා විද්‍යාලය, බදුල්ල | 1 |
| 85 | වැලිමඩ මහා විද්‍යාලය, වැලිමඩ | 1 |
| 86 | ශාන්ත ජෝසෙප් විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 87 | කන්දේගෙදර මහා විද්‍යාලය, කන්දේගෙදර | 1 |
| 88 | බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 89 | කුඩා කුසුම් බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 90 | පස්සර මධ්‍ය මහා විද්‍යාලය, පස්සර | 1 |
| 91 | විශාඛා බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 92 | කහගොල්ල මධ්‍ය මහා විද්‍යාලය, කහගොල්ල | 1 |
| 93 | නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලය, බඩල්කුඹුර | 1 |
| 94 | වෙල්ලස්ස ජාතික පාසල, වෙල්ලස්ස | 1 |
| | එකතුව | 11 |

| අනුක්‍රමික අංකය | නැගෙනහිර පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 95 | වින්සෙන්ට් උසස් බාලිකා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 96 | ශා. සිසිලියාස් බාලිකා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 97 | ශිවානන්ද ජාතික පාසල, මඩකලපුව | 1 |
| 98 | ශා. මයිකල් ජාතික පාසල, මඩකලපුව | 1 |
| 99 | පදිරිප්පු මධ්‍ය මහා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 100 | ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය, අක්කරේපත්තුව | 1 |
| 101 | ඩී. එස්. සේනානායක විද්‍යාලය, අම්පාර | 1 |
| 102 | කාමෙල් ෆැටිමා ජාතික පාසල, කල්මුනේ | 1 |
| 103 | දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල, දෙහිඅත්තකණ්ඩිය | 1 |
| | එකතුව | 9 |

| අනුක්‍රමික අංකය | උතුරු මැද පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 104 | අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 105 | මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලය, මැදිරිගිරිය | 1 |
| 106 | ස්වර්ණපාලි බාලිකා මහා විද්‍යාලය, අනුරාධපුර | 1 |
| 107 | රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, පොළොන්නරුව | 1 |
| 108 | ආනන්ද බාලිකා විද්‍යාලය, හිඟුරක්ගොඩ | 1 |
| | එකතුව | 5 |

| අනුක්‍රමික අංකය | උතුරු පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 109 | වෙම්බඩි උසස් බාලිකා විද්‍යාලය | 1 |
| 110 | හින්දු විද්‍යාලය, යාපනය | 1 |
| 111 | යාපනය මධ්‍ය මහා විද්‍යාලය, යාපනය | 1 |
| 112 | ශා. සේවියර් බාලිකා විද්‍යාලය, මන්නාරම | 1 |
| 113 | ශා. සේවියර් පිරිමි විද්‍යාලය, මන්නාරම | 1 |
| | එකතුව | 5 |

| අනුක්‍රමික අංකය | සබරගමු පළාත - ජාතික පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 114 | ආනන්ද මෛත්‍රීය මධ්‍ය මහා විද්‍යාලය, | |
| | බලංගොඩ | 1 |
| 115 | ඇඹිලිපිටිය ජනාධිපති ජාතික පාසල, ඇඹිලිපිටිය | 1 |
| 116 | කලවාන ජාතික පාසල, කලවාන | 1 |
| 117 | කෑ/ඩඩ්ලි සේනානායක ජාතික පාසල | 1 |
| 118 | මාවතගොඩ රිවිසඳ මධ්‍ය මහා විද්‍යාලය, උස්සාපිටිය | 1 |
| 119 | ජෙයිලනි මධ්‍ය මහා විද්‍යාලය, දෙහිගස්තලව | 1 |
| 120 | කොළොන්න මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 121 | සුමන බාලිකා විද්‍යාලය, රත්නපුර | 1 |
| 122 | සීවලී මධ්‍ය මහා විද්‍යාලය, රත්නපුර | 1 |
| 123 | ශා. ඇලෝසියස් මධ්‍ය මහා විද්‍යාලය, රත්නපුර | 1 |
| 124 | මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය, මාවනැල්ල | 1 |
| | එකතුව | 11 |

| අනුක්‍රමික අංකය | බස්නාහිර පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 125 | ශා. ක්ලෙයාර් බාලිකා විදුහල, කොළ 06 | 1 |
| 126 | සියලු ශාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලය, කොළඹ 08 | 1 |
| 127 | ශා. අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 09 | 1 |
| 128 | සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර විද්‍යාලය, කොළඹ 09 | |
| 129 | ක්ලිප්ටන් බාලිකා මහා විද්‍යාලය, කොළඹ 09 | 1 |
| 130 | රත්නාවලී බාලිකා මහා විද්‍යාලය, කොළඹ 08 | 1 |
| 131 | ලින්ඩ්සේ බාලිකා මහා විද්‍යාලය, කොළඹ 03 | 1 |
| 132 | ශා. තෝමස් විද්‍යාලය, කෝට්ටේ | 1 |
| 133 | ආනන්ද බාලිකා විද්‍යාලය, කෝට්ටේ | 1 |
| 134 | ජයවර්ධනපුර බාලිකා විද්‍යාලය, කෝට්ටේ | 1 |
| 135 | ජයවර්ධනපුර පිරිමි විද්‍යාලය, කෝට්ටේ | 1 |
| 136 | ආදර්ශ පිරිමි විද්‍යාලය, මාලබේ | 1 |
| 137 | ශා. මරියා බාලිකා විද්‍යාලය, මීගමුව | 1 |
| 138 | ශා. මරියා විද්‍යාලය, මතුගම | 1 |
| 139 | පානදුර බාලිකා විද්‍යාලය, පානදුර | 1 |
| 140 | ජනාධිපති විද්‍යාලය, හෝමාගම | 1 |
| 141 | හෝමාගම මහා විද්‍යාලය, හෝමාගම | 1 |
| 142 | ශා. ආනා බාලිකා විද්‍යාලය, වත්තල | 1 |
| 143 | විශාඛා බාලිකා විද්‍යාලය, සපුගස්කන්ද | 1 |
| 144 | නාලන්දා බාලිකා මහා විද්‍යාලය, මිනුවන්ගොඩ | 1 |

| අනුක්‍රමික අංකය | බස්නාහිර පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 145 | වාද්දුව මධ්‍ය මහා විද්‍යාලය, වාද්දුව | 1 |
| 146 | වලාන මහානාම මධ්‍ය මහා විද්‍යාලය, පානදුර | 1 |
| 147 | නිමල මරියා බාලිකා විද්‍යාලය, ජා-ඇල | 1 |
| 148 | ලලිත් ඇතුලත්මුදලි මහා විද්‍යාලය, ගල්කිස්ස | 1 |
| 149 | උසස් බාලිකා මහා විද්‍යාලය, ගල්කිස්ස | 1 |
| 150 | බෞද්ධ බාලිකා විද්‍යාලය, ගල්කිස්ස | 1 |
| 151 | ශා. ජෝසප් විද්‍යාලය, නුගේගොඩ | 1 |
| 152 | යශෝධරාදේවී බාලිකා මහා විද්‍යාලය, ගම්පහ | 1 |
| 153 | කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලය, ගම්පහ | 1 |
| 154 | සුජාතා බාලිකා විද්‍යාලය, නාවල, රාජගිරිය | 1 |
| 155 | ජයකොඩි මහා විද්‍යාලය, ගනේමුල්ල | 1 |
| | එකතුව | 31 |

| අනුක්‍රමික අංකය | දකුණු පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 156 | ශ්‍රී හර්දය කන්‍යාරාමය, ගාල්ල | 1 |
| 157 | සියළු ශාන්තුවරයන්ගේ විද්‍යාලය, ගාල්ල | 1 |
| 158 | ශාන්ත අන්තෝනි විද්‍යාලය, ගාල්ල | 1 |
| 159 | ජනාධිපති විද්‍යාලය, මාතර | 1 |
| 160 | අකුරැස්ස මධ්‍ය මහා විද්‍යාලය, අකුරැස්ස | 1 |
| 161 | මෙතෝදිස්ත මහා විද්‍යාලය, මාරවිල | 1 |
| 162 | පුවක්දන්ඩ මධ්‍ය මහා විද්‍යාලය, බෙලිඅත්ත | 1 |
| | එකතුව | 7 |

| අනුක්‍රමික අංකය | මධ්‍යම පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 163 | ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය, ගලේවෙල | 1 |
| 164 | ශා. අන්තෝනි විද්‍යාලය, මහනුවර | 1 |
| 165 | යහපත් එඬේරගේ කන්‍යාරාමය, නුවරඑළිය | 1 |
| 166 | ශා. සිල්වෙස්ටර් විද්‍යාලය, මහනුවර | 1 |
| 167 | ශා. අන්තෝනි බාලිකා විද්‍යාලය, මහනුවර | 1 |
| 168 | පේරාදෙණිය මධ්‍ය මහා විද්‍යාලය, පේරාදෙණිය | 1 |
| 169 | වාරියපොල ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය, මහනුවර | 1 |
| 170 | විහාරමහාදේවි බාලිකා මහා විද්‍යාලය, මහනුවර | 1 |
| 171 | ශාන්ත ජෝසෙප් විද්‍යාලය, ගම්පොල | 1 |
| 172 | වත්තේගම බාලිකා විද්‍යාලය, වත්තේගම | 1 |
| | එකතුව | 10 |

| අනුක්‍රමික අංකය | වයඹ පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 173 | මලියදේව ආදර්ශ මහා විද්‍යාලය, | |
| | කුරුණෑගල | 1 |
| 174 | වයඹ රාජකීය විද්‍යාලය, කුරුණෑගල | 1 |
| 175 | කාමෙල් බාලිකා විද්‍යාලය, හලාවත | 1 |
| 176 | මාරවිල ශා. ෂේවියර් විද්‍යාලය, | |
| | නාත්තන්ඩිය | 1 |
| 177 | ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලය, | |
| | මාරවිල | 1 |
| 178 | සුරදූත මහා විද්‍යාලය, කුලියාපිටිය | 1 |
| 179 | කටුකෙන්ද ශ්‍රී සංඝබෝධි මහා විද්‍යාලය | 1 |
| | එකතුව | 7 |

| අනුක්‍රමික අංකය | ඌව පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 180 | ගිරාදුරුකෝට්ටේ මධ්‍ය මහා විද්‍යාලය, | 1 |
| | ගිරාදුරුකෝට්ටේ | |
| 181 | විහාරමහාදේවි බාලිකා මහා විද්‍යාලය, | |
| | බදුල්ල | 1 |
| 182 | දෙමළ බාලිකා මහා විද්‍යාලය, බදුල්ල | 1 |
| | එකතුව | 3 |

| අනුක්‍රමික අංකය | නැගෙනහිර පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 183 | මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලය, | |
| | මඩකලපුව | 1 |
| 184 | හින්දු විද්‍යාලය, මඩකලපුව | 1 |
| 185 | විවේකානන්ද බාලිකා මහා විද්‍යාලය, මඩකලපුව | 1 |
| | එකතුව | 3 |

| අනුක්‍රමික අංකය | උතුරු මැද පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 186 | ගිරිතලේගම මහා විද්‍යාලය | 1 |
| 187 | ශා. ජෝසප් මහා විද්‍යාලය, අනුරාධපුර | 1 |
| 188 | මිහින්තලේ මහා විද්‍යාලය | 1 |
| | එකතුව | 3 |

| අනුක්‍රමික අංකය | සබරගමුව පළාත් පාසල් | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 189 | ශ්‍රී/බුද්ධජයන්ති ම.ම.වි., බලංගොඩ | 1 |
| 190 | ශාන්ත ඇග්නස් බා.ම.වි., බලංගොඩ | 1 |
| 191 | කරගස්තලාව ම.වි.. බෙලිහුල්ඔය | 1 |
| 192 | උඩුගම ම.වි., පින්නවල, බලංගොඩ | 1 |
| 193 | ශ්‍රී වලගම්මා ම.වි., වැලිගෙපොල, බලංගොඩ | 1 |
| 194 | විද්‍යාකර ම.වි., ඕපනායක | 1 |
| 195 | චන්ද්‍රිකාවැව ජයන්ති ම.වි., පදලන්ගල | 1 |
| 196 | කොළඹගෙආර ම.වි., කොළඹගෙආර | 1 |
| 197 | ඇඹිලිපිටිය ම.වි., ඇඹිලිපිටිය | 1 |
| 198 | මොරකැටිය ම.වි., ඇඹිලිපිටිය | 1 |
| 199 | උඩවලව ම.වි., උඩවලව | 1 |
| 200 | රත්නාලෝක ම.වි., රක්වාන | 1 |
| 201 | කේල්ල ම.වි., කොළොන්න | 1 |
| 202 | විජේරිය සුමන ම.වි., විජේරිය | 1 |
| 203 | අයගම ශ්‍රී රාහුල ම.ම.වි., රත්නපුර | 1 |
| 204 | කහවත්ත ම.ම.වි., කහවත්ත | 1 |
| 205 | කලාවන ගාමිණි ම.ම.වි., කොස්වත්ත, කලාවන | 1 |
| 206 | මීපාගම ජයන්ත ම.වි., කලාවන | 1 |
| 207 | ඇලපාත ම.වි., ඇලපාත, රත්නපුර | 1 |
| 208 | ශ්‍රී රත්නාකර ම.වි., උඩකරවිට | 1 |
| 209 | ශ්‍රී ජිනරතන ම.වි., කරදන | 1 |
| 210 | සිද්ධාර්ථ ම.වි., ගැටහැත්ත | 1 |
| 211 | කිරිඇල්ල ගාමිණී ම.වි.. කිරිඇල්ල | 1 |
| 212 | කුරුවිට ම.ම.වි.. කුරුවිට | 1 |
| 213 | ධර්මාලෝක ම.වි., පැල්මඩුල්ල | 1 |
| 214 | කුමාර විද්‍යාලය, රත්නපුර | 1 |
| 215 | බඹරබොටුව ම.වි., වේවැල්වත්ත, රත්නපුර | 1 |
| 216 | තල්දූව බෞද්ධ මහා විද්‍යාලය, අවිස්සාවේල්ල | 1 |
| 217 | අමිතිරිගල ම.වි., අමිතිරිගල | 1 |
| 218 | වහරක මහා විද්‍යාලය | 1 |
| 219 | රත්නාවලී ම.වි., මත්තමගොඩ, කන්නන්තොට | 1 |
| 220 | සිරිවර්ධන ම.වි., යටියන්තොට | 1 |
| 221 | දැඩිගම පැරකුම්බා ම.වි., තුන්තොට | 1 |
| 222 | ගලිගමුව ම.ම.වි., ගලිගමුව නවනගරය | 1 |
| 223 | බණ්ඩාරනායක ම.වි., හෙට්ටිමුල්ල | 1 |
| 224 | මාබෝපිටිය ම.වි., මාබෝපිටිය, උඳුගොඩ | 1 |
| 225 | මහානාග ම.වි., රංවල, කෑගල්ල | 1 |
| 226 | ස්වර්ණජයන්ති ම.වි., කෑගල්ල | 1 |
| 227 | අල්ගම ම.ම.වි., අල්ගම | |
| 228 | බාබුල් හෂින් මුස්ලිම් ම.වි., වරකාපොල | 1 |
| 229 | ධර්මසිරි සේනානායක ම.වි., තුල්හිරිය | 1 |
| 230 | සිරිනිවස ම.වි., දොරවක | 1 |
| 231 | රාජගිරි ම.වි., දිප්පිටිය, අරනායක | 1 |
| 232 | බදුරිය මුස්ලිම් මහා විද්‍යාලය, මාවනැල්ල | 1 |
| 233 | නාගරගිරි ම.වි., හෙම්මාතගම | 1 |
| 234 | අසෝක ම.වි., කිරිවැල්ලපිටිය, රඹුක්කන | 1 |
| 235 | පරාක්‍රම ම.වි., රඹුක්කන | 1 |
| 236 | කුලරත්න ම.ම.වි., ගොඩකවෙල | 1 |
| 237 | ශ්‍රී සුමන ම. වි. රත්නපුර | 1 |
| 238 | අල් අසාර් මුස්ලිම් ම.වි., හුංගම, හෙම්මාතගම | 1 |
| | එකතුව | 50 |

04. සේවා කොන්දේසි :

4.1 රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවන් අතුරින් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව) රු. 14135 - 180 x 9 - 240 x 6 - 330 x 5 - 400 x 7 - 645 x 13 - රු. 30030ක් වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 8 වන පියවර වන රු. 15,395/ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

මෙහි 1.2.2 හා 1.2.3 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් මත බඳවා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලබන අතර, මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව) රු. 13,120 - 145 x 10 - 180 x 5 රු. 13,120/ වේ.

4.2 ඔබට පත්වීම ලබා දෙනු ලබන පාසල තුළ අනිවාර්යයෙන්ම වසර 05ක කාල සීමාවක් සේවය අනිවාර්ය වේ.

4.3 මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

4.4 තනතුරට හිමි උසස්වීම ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

05. අයදුම් කිරීමේ ක්‍රමය :

5.1 අයදුම් පත්‍රය මෙම නිවේදනයේ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින් ම පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය) සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකි ය.

5.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

5.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2014.10.13 දිනට හෝ ඊට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට බටහිර සංගීත ගුරුවරුන් බඳවා ගැනීම - 2014" ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු ය.

5.4 සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

6. දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 06 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කර ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

7. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගි නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

8. එමෙන් ම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

9. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද, කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින් ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 12 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු සඳහා
ශ්‍රී ලංකා ගුරු සේවයට
බටහිර සංගීත ගුරුවරුන් බඳවා ගැනීම - 2014

* ගැසට් නිවේදනයේ ශීර්ෂ අංක 1.2.1. යටතේ උපාධි සුදුසුකම් මත අයදුම් කරන්නේ නම් පහත කොටුව තුළ අංක 1 ද, ශීර්ෂ අංක 1.2.2 හෝ 1.2.3 ට අදාළ සුදුසුකම් මත නම් අංක 2 ද යොදන්න.

[ ]

* පුවත්පත් නිවේදනයේ ශීර්ෂ අංක 03හි උපලේඛන 2 අනුව ඔබගේ ජාතික හෝ පළාත් පාසල් පත්වීම් ලැබීමේ කැමැත්ත අනුපිළිවෙළින් අදාළ අනුක්‍රමික අංක මගින් දක්වන්න (මෙම අනුපිළිවෙළ පසුව කිසිසේත් වෙනස් කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න) පහත වගුවේ 1.2.3. වශයෙන් දක්වා ඇත්තේ කැමැත්තේ අනුපිළිවෙළ වන අතර, ඔබගේ කැමැත්ත අනුව ජාතික හා පළාත් පාසල් සඳහා උපලේඛනයේ 2 සඳහන් පරිදි අනුක්‍රමික අංක 03ක් පමණක් කොටුව තුළ ලියන්න).

| 1 | | 2 | | 3 | |
|---|---|---|---|---|---|

1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් (උදා :- PERERA A. B) :————.

1.2 මුල'කුරුවලින් දැක්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2.0 වර්තමාන ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3.0

3.1 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | |

3.2 උපන් දිනය වර්ෂය මාසය දිනය

3.3 2014.10.13 දිනට වයස අවු. මාස දින

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1, පුරුෂ - 0)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.5 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1, විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

4.1 උපාධිය/බටහිර සංගීතය vi වන වන ශ්‍රේණිය සමත් විශ්ව විද්‍යාලය/ආයතනය :————.

4.2 වලංගු දිනය :————.

4.3 හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මම දනිමි. තව ද ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පත්වීම් බලධරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

5.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

6.0 අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

............................................................ මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

09 - 372

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.